# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 275 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 15/02/2024 පැය 1930

**මාධ්‍ය නිවේදනය**

**කල්පිටිය පොලිස් ස්ථානාධිපතිවරයාගේ රාජකාරි වැඩ තහනම් කිරීම - පොලිස් මූලස්ථානය.**

කාන්තා පොලිස් කොස්තාපල්වරියකට ලිංගික අතවර සිදුකළ බවට කල්පිටිය පොලිස් ස්ථානාධිපතිවරයාට විරුද්ධව වයඹ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ නියෝග පරිදි කුලියාපිටිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් විමර්ශනයක් ආරම්භ කර පුත්තලම ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර තිබුණි.

මෙම සිදුවීමට සම්බන්ධ පොලිස් පරීක්ෂකවරයා 2024.02.13 වන දින පුත්තලම ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් වීමෙන් පසු ඇප මත මුදා හරින ලදී.

මේ සම්බන්ධව පොලිස් මූලස්ථානය මගින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම නිලධාරියාගේ රාජකාරි වැඩ තහනම් කරන ලදී.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,
පොලිස් මාධ්‍ය කොට්ඨාසය